# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ඉහළ දිස්ත්‍රික්කයේ වටවල අංගනයේ CHECK RAILED TRACK එක සඳහා EN 45 E1 රේල්පීලිවලට සුදුසු උසින් අඩු කොන්ක්‍රීට් සිල්පර 4,000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දේශීය නිෂ්පාදකයන් / සැපයුම්කරුවන් වෙතින්, **ඉහළ දිස්ත්‍රික්කයේ** වටවල අංගනයේ Check Railed Track එක සඳහා EN 45 E1 රේල්පීලිවලට සුදුසු උසින් අඩු කොන්ක්‍රීට් සිල්පර 4,000 ක් සැපයීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබාගැනීමත්, ලංසු ලේඛන පරීක්ෂා කොට බැලීමත්, පහත සඳහන් ලිපිනයේදී 2023.01.26 දින සිට 2023.02.21 දින දක්වා පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ රාජකාරී දිනවලදී සිදුකළ හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94 (11) 2438078 හෝ 94 (11) 2436818** |
| **ෆැක්ස් අංක** | : | **94 (11) 2432044** |
| **ඊමේල්** | : | **srs.slr@gmail.com** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

04. ලංසුකරු විසින්, පසුගිය වසර පහ (05) තුළ, ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා කොන්ක්‍රීට් සිල්පර 5,000 හෝ වැඩි ප්‍රමාණයක් හෝ වටිනාකම රුපියල් මිලියන 50 ඉක්මවූ පෙර - වැර කොන්ක්‍රීට් බාල්ක හෝ වටිනාකම රුපියල් මිලියන 500 හෝ ඊට වැඩි පෙර - වැර කොන්ක්‍රීට් කණු සපයා තිබිය යුතු අතර, අදාළ ඉන්වොයිස්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

05. ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තු රුපියල් 30,500/- පමණක් ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, **2023.01.26 දින සිට 2023.02.21 දින දක්වා ප.ව. 3.00 දක්වා**, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට **ඉංග්‍රීසි භාෂාවෙන්** සකස් කරන ලද සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදීගත හැක.

06. සියලුම ලංසු සමග, වටිනාකම **රුපියල් 1,700,000.00** ක්වූ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් මගින් නිකුත් කළ, කොන්දේසි විරහිත ඇපකරයක් ලෙසින් වූ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

07. සම්පූර්ණ කළ ලංසු, 2023.02.22 දින ප.ව. 2.00 ට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතු අතර, අදාළ අවසන් කාලය ඉකුත් වූ වහාම ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F. 7898**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

A.M.U.S. WIJEWARDENA
Procurement Officer (Covering)
Railways Stores Department
Sri Lanka Railways
Colombo 10